**මොරටුව විශ්වවිද්‍යාලය - 2019**

**--------------------------------------------**

## 1.1 මතය

**------**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 – (2) (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාවට අනුව නඩත්තු ගබඩාවෙහි රු.3,304,883 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් 2020 ජූලි 07 දින දක්වා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි . | මේ සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බැලීමටත් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සතුව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ වන විට 2013 දෙසැම්බර් 31 දින දක්වා අත්පත් කරගත් සියළු වත්කම්වල ප්‍රත්‍යාගණන අගයන් හා 2018 දක්වා මිලදී ගත් වත්කම්වල අගයන් | ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි පිළියෙල කර යාවත්කාලීනව පවත්වා ගත යුතුයි. |

| | | |
|---|---|---|
| | ඇතුළත් කර ඇත. 2019 වර්ෂයේ මිලදී ගත් ස්ථාවර වත්කම් වලින් කිහිපයක් ද දැනට සම්පූර්ණ කර ඇති මට්ටමින් මෙම ස්ථාවර වත්කම් ලේඛනය ලබා දිය හැකි ය. | |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.458,904,896 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 98,671,571 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.360,233,325 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වෙනුවෙන් රජයේ ප්‍රදාන ලැබීම් රු.427,570,000 කින් වැඩි වුව ද පෞද්ගලික පඩිනඩි රු. 417,211,176 කින් ද වාර්ෂික පාරිතෝෂක වියදම රු. 329,996,358 කින් ද හා ගිවිසුම්ගත සේවා වියදම රු. 43,303,426 කින් ද ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු
------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවැරදි සැලසුමක් නොමැති වීම හේතුවෙන් සිදු කරන ලද උද්‍යාන අලංකරණය නියමිත පරිදි ඉටු කර නොතිබීම හේතුවෙන් පුද්ගලික කොන්ත්‍රාත් සමාගමක් වෙත ගෙවන ලද රු.3,093,310 ක් අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේදී විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත විවිධ අවස්ථාවන්හිදී විචලන නියෝග නිකුත් කොට වැඩ කටයුතු කෙරී තිබුණ අතර විෂය පථයෙහි අඩංගු කරුණුවලත් වෙනස් වූ අවස්ථා ද විය. කෙසේ නමුත් ව්‍යාපෘතිය තුල කොන්ත්‍රාත්කරු විසින් ඉටුකරන ලද කාර්යයන් සඳහා භෞතිකව පිරික්සා අදාල සහතිකය හා නිර්දේශයන් ලබාගෙන රු.3,094,759 ක ගෙවීමක් සිදුකර ඇති අතර එහි වියදම විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන් සඳහා සිදුකර ඇති නිසා එය අනාර්ථික වියදමක් ලෙස සැලකිය නොහැකිය. | නිසි පරිදි පිළයෙල කරන ලද සැලසුම් මත කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවූ ආචාර්යවරුන් 37 දෙනෙකුගෙන් ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.76,861,700 ක් අයවිය යුතුව පැවති අතර එහි වසර 20 ක් ඉක්මවා තිබූ ආචාර්යවරු 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 5,826,861 ක් විය. | 2019 වර්ෂයේ දී රු.17,100,722ක මුදලක් බැඳුම්කර කඩකල නිලධාරීන්ගෙන් අය කරගැනීමෙන් පසු 2019.12.31 දිනට රු.76,861,700ක මුදලක් අය විය පවතී. ගිවිසුම් හා බැඳුම්කර කඩකර වසර 20 ඉක්මවූ නිලධාරීන් 10 දෙනා සම්බන්ධයෙන් බැඳුම්කර සමාලෝචන කමිටුවෙහි උපදෙස් හා මගපෙන්වීම මත අයකරගැනීම් කඩිනම් කිරීමට කටයුතු කරමින් පවතී. | ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් බැඳුම්කර වටිනාකම අයකිරීමට කටයුතු කල යුතු අතර නොගෙවන ආචාර්යවරුන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගත යුතුය. |
| (ආ) යුනි කන්සල්ටන්සි සමාගමට නෛතික රාමුවක් ඇතිකර ගැනීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙස නියෝග කර ඇති නමුත් වාර්තාවේ දිනය දක්වාම කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | යුනි කන්සල්ටන්සි සමාගමට නෛතික රාමුවක් ඇතිකර ගැනීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට කැබිනට් අනුමැතියක් ලබාගන්නා ලෙස නියෝග කර ඇති අතර ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කටයුතු කරමින් පවතී .ඒ අනුව 2020 සැප්තැම්බර් මස වන විට අනුමැතිය සඳහා අමාත්‍යමණ්ඩල පත්‍රිකාව අමාත්‍යාංශයට යොමු කිරීමට නියමිතව ඇත. | කැබිනට් අනුමතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව මිලදීගෙන තිබුණු එකතුව රු.5,422,227 ක් වූ ටෝනර් සහ කාට්රේජ් 397 ක් ප්‍රධාන ගබඩාව තුළ පැවතුණි. | මෙම ටෝනර් සහ කාට්රේජ් ඉදිරියේදී අවශ්‍ය දෙපාර්තමේන්තු හා අංශ වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාවය හඳුනාගෙන ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| (ආ)විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරණු ලබන BIT" පාඨමාලාව සඳහා පෞද්ගලික ආයතන සමග එළැඹි ගිවිසුම්වලට අනුව එක් එක් ආයතනය විසින් වර්ෂයකට 60 දෙනෙකුගෙන් යුත් අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගත යුතු වුවද කාලපරිච්ඡේදය තුළ සිසුන් 14 සිට 40 අතර ප්‍රමාණයක් බඳවා නොගැනීම හේතුවෙන් එම පෞද්ගලික ආයතන දෙකකින් ආයතනයට අයවිය යුතු එකතුව රු.8,255,000 ක් අයකර ගැනීමට විගණන දිනය වූ 2020 අගෝස්තු 10 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ "BIT " පාඨමාලාවෙන් උපයා ගෙන තිබූ ආදායමෙන් රු.13,016,437 ක් පරිපාලන ගාස්තු ලෙස අදාල ගිවිසුමේ පාර්ෂවයක් නොවන UNI Consultancy සමාගම වෙත ගෙවා තිබුණි. | 2018 වර්ෂය අවසානය දක්වා මෙම CODL මධ්‍යස්ථානය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොතිබූ බැවින් අවශ්‍ය සේවකයන් බාහිරින් ලබාගත යුතුව තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය සේවකයන් Uni Consultancy නමැති ආයතනයෙන් ලබාගන්නා ලද අතර එම සේවකයන්ගේ වැටුප් වෙනුවෙන් රු.13,016,437 ක් ඉහත කාල සීමාව සඳහා ගෙවන ලදි. එය සෘජු වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. මේ වන විට මෙම මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය සේවකයින් බඳවාගෙන ඇත. ඉදිරියේදී මේ ලෙස Uni Consultancy ආයතනය වෙත ගෙවීමට අවශ්‍ය නැත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 අරමුදල් ඌන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයීය පාඨමාලා හා දෙපාර්තමේන්තු 35 ක සංවර්ධන අරමුදල් එකතුව රු.13,137,228 ක් වර්ෂය තුල අක්‍රීයව පැවති අතර අරමුදල් 27ක එකතුව රු.50,475,124 ක් | මෙම අරමුදල් එක් වර්ෂයක් හෝ වර්ෂ කිහිපයක් අක්‍රියව පැවතියත් ඒවා ඉදිරියේදී අදාල කාර්යයන් සඳහා භාවිතා කරනු ලැබේ. බාහිර ආයතනයක් විසින් සපයන ලද අරමුදල් නොවන බැවින් ඒවා කිහිපයක් | අරමුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැයකළ යුතුයි. |

| | | |
|---|---|---|
| ඌන උපයෝජිතව පැවතුණි. | වියදම් නොකර සංචිතයක් ලෙස තබාගැනීමේ ගැටළුවක් නොමැත . | |
| (ආ) 2019 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 4,548,539 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 26ක් වසර 10කට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවති අතර ශිෂ්‍යත්ව පිරිනැමීමේ නිර්නායක වල පවතින ගැටළු ඒ සඳහා හේතු වී තිබුණි. | මෙම ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් අදාල කමිටුවේ වාර්තාව ඉක්මනින් ලබා ගැනීමටත් ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරනු ලැබේ. | නිර්ණායක වල පවතින ගැටළු නිරාකරණය කර අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අරමුදල් යොදා ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 987 ක් හා 873 ක් වූ අතර තත්‍ය අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 588 ක් හා 676 ක් වූයෙන් පුරප්පාඩු පිළිවෙලින් 399 ක් හා 197 ක් විය. පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත 80 දෙනෙක් බඳවා ගෙන තිබූ අතර අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.37,600,964 ක දීමනා ගෙවා තිබුණි. | අධ්‍යයන හා අධ්‍යයන සහායක පුරපුපාඩු අදාල අංශවල අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම්වලට අනුව පිරවීමට කටයුතු කරන අතර අනධ්‍යයන සේවක පුරප්පාඩු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන ලැයිස්තු මගින් පිරවීම සඳහා කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුයි. |